# <u>ස්වයං අධ්‍යනයට අත්වැලක්</u>

**ශ්‍රේණිය - 06** **වාරය - II වාරය**

**නිපුනතා මට්ටම - 3.2 -: විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි.**

**ක්‍රියාකාරකම - 3.2.1 -: විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරමු.**








**සැකසුම - S.A.තිලකා සමරසිංහ.**

**මප/වත්/ මහසෙන් මහා විද්‍යාලය.**

**මෙහෙයවීම - නර්තන අංශය.**

**කලාප අධ්‍යාපන කාර්යාලය,**


**වත්තේගම.**

**උපදෙස් -:** මෙය ප්‍රායෝගික නිර්මාණ කරණයට අයත් පාඩමකි. පාඩම වැඩිදුර අධ්‍යනයට ගුරු භවතාගේ සහය ලබා ගන්න.

**හැඳින්වීම -:**

මෙම පාඩමෙන් නර්තන නිර්මාණයේ දී විවිද ශබ්ධ හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය පිළිබදව අවබෝධයක් ලබා දීමට අපේක්ෂා කරමි.

විවිධ ශබ්ද හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය පිළිබදව 07 ශ්‍රේණියේදී තවදුරටත් වැඩිදුර අධ්‍යනය කෙරෙයි.







# විකල්ප වාද්‍ය උපකරණ යනු

විකල්ප වාද්‍ය උපකරණ ලෙස හදුන්වනු ලබන්නේ ඉවතලන උපයෝගී කරගෙන සුළං මගින්, දැත් හා උපකරණ ආදී දේ යොදාගෙන තට්ටු කිරීමෙන්, සෙලවීමෙන්, තෙරපීමෙන් හෝ පිඹීමෙන් හඬ උපදවා ගැනීමට හැකි ආකාරයට නිපදවා ගත් භාණ්ඩයි.





# විකල්ප වාදන උපකරණ නිර්මාණයට යොදා ගන්නා

ගස්ලබු බට

එක්ස්රේ කාඩ්

උණ බට

ලී කැබලි

සිහින් කම්බි කූරු

ප්ලාස්ටික් ටින් බෝතල

ටොනික් මූඩි

පොල් කටු

ප්ලාස්ටික් බට

වීදුරු බෝතල

මැටි පිත්තල කල

ටින්

# විකල්ප වාද්‍ය භාණ්ඩ


උණ බට බෙර


ටින් බෙර


පොල් කටු තාලම්පට


ගොක්කොල බටනළාව


එක්ස්රේ රබාන


ටොනික් මුඩි සොලවනය


ප්ලාස්ටික් බටනළාව


වීදුරු සොලවනය

# හඬ උපදවා ගන්නා විවිධ ක්‍රම ශිල්ප

## ඇතිල්ලීමෙන්




- ටින් පියන් පත් දෙකක් එකට ඇතිල්ලීම.
- ගල් දෙකක් එකට ඇතිල්ලීම.
- ටින් එකක් බිම ඇතිල්ලීම.
- රිජිෆෝම් කැබලි දෙකක් එකට ඇතිල්ලීම.

## සෙලවීමෙන්

- ටින් එකකට ගල් කැට/වැලි දමා සෙලවීම.
- විවිධ ප්‍රමාණයේ එක්ස්රේ කොළ සෙලවීම හා සිලි කවර සෙලවීම.
- පොල් ගෙඩියේ මදය ඉවත් කර එයට ගල් කැට දමා සෙලවීම.





## තට්ටු කිරීමෙන්/ තැලීමෙන්



- ලී දෙකක් එකට තට්ටු කිරීම.
- ලී පෙට්ටියකට හෝ කාඩ්බෝඩ් පෙට්ටියකට හෝ තට්ටු කිරීම නැතහොත් ප්ලාස්ටික් කෑන් වලට තට්ටු කිරීම.

## තැලීම

- කුඩා වීදුරු බෝතල්වලට විවිධ ප්‍රමාණයෙන් ජලය දම ලෝහ කූරකින් බෝතලයට තට්ටු කිරීම.

## පිඹීමෙන්

- ගස්ලබු දණ්ඩේ කෙලවරට ඉපියක් දමා පිඹීම.
- එස්ලෝන් බටයක සිදුරු සකසා බටනළාවක් මෙන් සකස් කර පිඹීම.
- ගස්වල කොළ වර්ගවලින් නළා සෑකසීම.



# විකල්ප වාදන උපකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු

පරිසරයෙන් සොයා ගත හැකි ඉවතලන දෑ යොදා ගැනීම

සරල විය යුතුය.

එහා මෙහා පහසුවෙන් ගෙන යා හැකි බව.

වාදනය පහසු විය යුතුය.

විවිධ නාද ශබ්ද නිපදවිය හැකි වීම.

# විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය

## බෙරය


<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- ලොකු ප්ලාස්ටික් බදුනක්
- කෝටුවක් (කෝටුවේ මුල් කොටස රෙදි පටි එතීම)

<u>වාදනය කිරීම.</u>

ප්ලාස්ටික් බදුනට කොටුවෙන් ගැසීම.විවිධ ශබ්ධ ඇතිවන පරිදි බදුනෙහි ස්ථාන වලට වාදනය කිරීම.( X ලකුණ යොදා ඇති ස්ථාන)

ඝෝෂාකාරී හඬක් නිකුත් වේ.



# ටින් බෙරය

## I ක්‍රමය

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- ටින් එකක්
- කෝටුවක්

<u>වාදනය කිරීම.</u>


ටින් එකට ඇඟිලි වලින් හෝ කෝටුවකින් වාදනය කල හැකිය. තට්ටු කරන ස්ථානය අනුව ශබ්ධය වෙනස් වේ.



## II ක්‍රමය

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- ටින් එකක් හෝ කවාකාර කුහර සහිත බදුනක්.
- බැලුන් 02 ක්.



<u>සකසන අයුරු</u>

ටින් එකෙහි හෝ වෙනත් කුහර සහිත බදුනෙහි හෝ දෙපැත්ත හිස්ව තිබිය යුතුය. බැලුන් දෙකක් ගෙන එහි මුල් කොටස කපා කවාකාර කොටස, සකස් කර ගත් බදුනෙහි දෙපැත්තට යොදා මුහුණත රබර් පටියකින් හෝ නුලකින් තද කර බදින්න. මෙය කෝටුවකින් හෝ අතින් වාදනය කල හැකිය.වාද්‍ය උපකරණයේ රබර් දවටනය මැදින් ඇද, ඇතහැරි විට ශබ්ධයක් නිකුත් වේ. (X ලකුණ බලන්න.)

# එක්ස්රේ බෙරය

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- එක්ස්රේ කොලයක්
- ලී කැබලි වලින් සකසන ලද ප්‍රේම් එකක්

<u>සකසන අයුරු</u>

අගල් 2ක් 3ක් දක්වා වූ කවාකාර හෝ හතරැස් හෝ අවකාශයක් සැකස ගත යුතුය. ලී කැබලි කීපයක් ඒ සදහා අවශ්‍ය වේ.දෙවනුව එය මතට එක්ස්රේ කොලයක් තබා ලී කද මත කුඩා ඇණ ගසා තද කර ගන්න. මෙහි දී එක්ස්රේ කොලය තදට සිටින පරිදි සකසා ගත යුතුය.



# සොලවනය

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

- ටින් එකක් හෝ ප්ලාස්ටික් බදුනක් (උස් සහ පැතලි)
- ගල් කැට කිහිපයක්

<u>සකසන අයුරු</u>

ටින් එකකට හෝ ප්ලාස්ටික් බදුනට ගල්කැට කිහිපයක් දමන්න.එයට තට්ටු කරන්න. එවිට ශබ්ධයක් නිකුත් වේ.




# විධිමත් ශබ්ද නිපදවිය හැකි භාණ්ඩ නිර්මාණය

01 කුඩා ගම් බෝතල් කිහිපයක් ගෙන එයට විවිධ මට්ටම් වලට වතුර පුරවා පිබීමෙන් ශබ්ද ඉපදවිය හැකිය. ඊට අමතරව පිබින ගමන් බෝතලය තද කිරීමෙන් හා බුරුල් කිරීමෙන් ශබ්දය උස් පහත් වේ.



**02** ටින් එකක් (සැමන් නැතහොත් කිරි ටින්) ගෙන එහි එක් පැත්තක් විවර කර අනෙක් පැත්තේ අඩිය මැද කුඩා සිදුරක් කර ගන්න. පසුව එම සිදුර මැදින් කුඩා හණ ලණුවක් හෝ තරමක් විශාල නූලක් හෝ දමා අග ගැට ගසා පහලින් එල්ලෙන සේ සකස් කර ගන්න. නූලට භූමිතෙල් ස්වල්පයක් දමා ඇඟිලි දෙකකින් පහලට අදින්න.ශබ්ද නිකුත් වේ.



03 අගල් ½ කින් යුත් දිග අඩි 2-3 දක්වා වූ බටයක් වතුර භාජනයකට දමා බටය මුඛය මත තබා තොල්වලින් පිබීමෙන් ශබ්ධ නිකුත් වෙයි.

